# අපේ අවුරුදු

ගහ කොළ මතට මැළවුණු නියඟයට දැඩී
මල් වැසි වැටී පිබිදෙයි අතු රිකිළි පොඩී
නිල් තැනිතලා මත හෙමිහිට තබන අඩී
මෙල්බන් පුරට නව අවුරුදු කුමරු වඩී

එරමුදු ගසක සිට කොවුලන් දෙන නාදේ
සවනට නොඇසුනද එය ගැන නැත වාදේ
අතිරස කැවුම් සමගින් කිරිබත සෑදේ
මෙවරත් ජයයි සිංහල අවුරුදු සාදේ

ජාතික සෙල්ලමට මුල්තැන දෙන කවදත්
අවුරුදු උළෙල මුළුදෙයි මෙල්බන් මෙවරත්
එකමුතු කමෙහි ඇති බල මහිමය නැවතත්
පෙන්වන්නේය මේ සුපුරුදු කම හිතවත්

ඉටුවෙයි සියලු පිළිවෙත් අනුවම නැකත
සුවසෙත සදයි වෙහෙරෙහි සදහම් පිරිත
ගරුකොට අපේ උරුමය ඔසවා දෙඅත
මේ හිම බිමෙහි පිබිදෙයි අවුරුදු සිරිත

සුපුරුදු හැඟුම් පිබිදෙයි නුපුරුදු දේසේ
දිව යන්නේය හිත මව්බිම වෙත රාසේ
දෙසවන මිහිරි කරවන මංගල මාසේ
කොවිලනි වරෙව් ගෙන නුඹලගෙ ජය ගෝසේ

**ජගත් වෙත්තසිංහ**
ක්රේගිබර්න්



සිතුවම පුණ්‍යා මුණසිංහ



## අලුත් පුවත් පතක් අලුත් ගමනක්

අපි සන්නස සමඟින් දෙවසරක් අතිෂය දුෂ්කර ගමනක් ගෙවා ආවෙමු. පියවරෙන් පියවර අසීරුවෙන් දෙපා ඔසවා ආ මේ ගමන අපට ගෙන දුන් අත්දැකීම් රැසකි. අපට හමු වූ දහසක් හොඳ මිනිසුන් බෙදා දුන් ගුණ සුවඳ අපට සදා ආශ්වාදය කි. වෙහෙස නොබලා ඉදිරියට යන්නට අප දිරි ගන්වන්නේ එවන් දුටු නොදුටු හිතවතුන් ය හිතවතියන් ය.

ලොව පුරා විසිරුණ අපේ පාඨක සමාජය අපට දිරියකි. අන්තර්ජාලය ඔස්සේ සන්නස කියවා ඊමේලයකින් අප අමතන ඔබ අප වෙහෙස නිවයි. අපෙන් පිලිතුරක් නොලැබුණ ද ඔබ අප හා එක්ව සිටින බව අපි දනිමු.. ඔබේ සෙනෙහස මහ මුහුදු පසුකර විත් අප කම්පනයට පත් කරයි.

අද වන විට සන්නස අන්තර්ජාලය ඔස්සේ බොහෝ දෙනෙක් කියවන පුවත්පතක් බවට පත්ව ඇත්තේ අන්තර්ජාතික ශ්‍රී ලාංකික සන්නිවේදනයේ අලුත් පැතිකඩක් ප්‍රදර්ශණය කරමිනි.

තව දුරටත් ඔස්ට්‍රේලියාව ඉලක්ක කර ගත් පුවත්පතකින් පමණක් සෑහීමකට පත්වන්නට අපට හැකියාවක් නැත. අපි ශ්‍රී ලාංකික පුවත්පත අන්තර්ජාතික තලයකට ඔසවා තබන්නට වෙර දරමින් සිටින්නෙමු.. කිසිවක් නොකර සිටිනවාට වඩා යමක් කරන්නට උත්සාහ දරන්නට අපි කැමැත්තෙමු.

අද වන විට අපි අන්තර්ජාතික මාධ්‍ය ජාලයක් ගොඩ නැගීමේ කර්තව්‍යයට අත ගසා ඇත්තෙමු. මේ සඳහා අවශ්‍ය වෙනස්කම් සඳහා දැන් සිටම අපි සූදානම් වන්නෙමු. සන්නස අරඹා වසර දෙකක් ගිය තැන, අද, අපි අලුත් පුවත්පතක් සමඟින් ඔබ හමුවට එන්නෙමු. සන්නස.... නව සහශ්‍රයට. මේ අපේ අලුත් පුවත්පතයි. මේ අපේ අලුත් ගමනයි. සන්නස පුවත් පත තුළින් ඔබ ට ගෙන ආ සියලුම විශේෂාංග අලුත් පුවත්පත තුළින්ද ඔබ හමුවට එනු ඇත.

අපි අන්තර්ජාලය, මුද්‍රිත මාධ්‍ය ය, ගුවන්විදුලිය හා රූපවාහිනිය එක්කරමින් අන්තර්ජාතික මාධ්‍ය ජාලයක් කරා දැන් පිය ඔසවමින් සිටින්නෙමු. මේ පිලිබඳ සියලු විස්තර ඉදිරියේ දී ඔබ හමුවට ගෙනෙන්නට අපි පුල පුලා බලා සිටින්නෙමු.

අප හා එක්ව සිටින්න. ඊයේ අද මෙන් හෙටත් අපි ඔබට හොඳ දෙයක්ම දෙන්නට ඇප කැපවන්නෙමු.

**ජගත් ජේ එදිරිසිංහ**
සංස්කාරක


සන්නස නව සහශ්‍රයට SANNASA

**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

**තාක්ෂණ සහය**
දසුන් ගජමන් Dasun Gajaman

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe
**වර්ණ සංයෝජනය**
ඉනෝකා දිසානායක

**සම්බන්ධීකරණය**

**NSW** Lakshman Kodituwakku 02 9626 7660 02 9837 5055
**WA** Kapila Hemantha Balage 08 9456 1972
**QLD** Ananada Samaratunga 07 3372 7953
**ACT** Asoka Nimalasiri 0400 429 031
**SA** Chandta Eeriyagama
**TAS** Anura Seneviratne 03 6327 4259

**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380



පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත


## සංස්කාරක සටහන

සන්නස නව සහශ්‍රයට පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.